**අකුරැස්ස ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු තානායම්වත්ත නොහොත් මිරිස්වත්ත ඉඩමේ පිහිටි පොදු වැසිකිලියෙහි තක්සේරු වටිනාකම වූ රු.1,368,000 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු උසාවි දඩ රු.1,371,226 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගෙවිය යුතු වියදම් රු.112,447 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | රු.295,990 ක වටිනාකමින් යුතු ඉන්වෙන්ට්‍රි ස්වරූපයේ අයිතම 23 කට අයත් ඒකක 106 ක් හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කළයුතු වටිනාකම රු.88,400 ක් වූ වත්කම් අයිතම 4 කට අයත් වත්කම් ඒකක 6 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබූ වාහන 5 ක එකතු වටිනාකම රු.13,343,116 ක් අඩුවෙන් හා වාහන 2 ක එකතු වටිනාකම රු.12,126,666 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 38 ක් වෙනුවෙන් අයවිය යුතු රු.488,900 ක් ගිණුම්ගත කර නොතිබුණි. | බලපත්‍ර ගාස්තුව අයකරනු ලැබූ පසු ගිණුම්ගත කරනු ලබන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයකට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.187,607 ක වෙනසක් පැවතුණි. | 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නඩු පවරන ලද ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර හිග ආදායම සඳහා උසාවි දඩ වශයෙන් අයවී ඇති බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.371 | වැඩමුළුවක් සඳහා අග්‍රිම සීමාව ඉක්මවා සභාවේ ලේකම් විසින් රු.300,000 ක අත්තිකාරම් මුදලක් ලබාගෙන තිබුණි. | ලේකම් විසින් එම මුදල ලබා ගෙන නිසි පරිදි වියදම් දරා අග්‍රිමය පියවීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 සැප්තැම්බර් 29 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | හේනෙගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත්කාර සමිතියකට අවස්ථා දෙකක දී රු.4,517,033 ක ගිවිසුම්ගත මුදලකට පවරා තිබූ නමුත් අදාල කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වීම මත C-4 ශ්‍රේණියේ වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා දී තිබුණි. | සභාව අනුමත සමිතියක් සමඟ ගිවිසුම්ගත වී ඇති බවත්, කොන්ත්‍රාත්තුව පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉටු කරවා ගැනීම පිළිබඳ සභාව දැනුවත් වී නොමැති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 9,355,475 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.925,273 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023<br>ඇස්තමේන්තු ගත ආදායම | 2023<br>බිල් කළ ආදායම | 2023<br>රැස්කළ ආදායම | 2023<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022<br>ඇස්තමේන්තු ගත ආදායම | 2022<br>බිල් කළ ආදායම | 2022<br>රැස්කළ ආදායම | 2022<br>දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,551,000 | 3,971,428 | 4,160,242 | 1,952,381 | 7,451,000 | 2,425,027 | 2,235,903 | 2,141,195 |
| (ii) | කුලී | 8,900,000 | 4,931,537 | 4,078,684 | 7,649,077 | 6,850,000 | 5,488,380 | 7,603,326 | 6,796,224 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,198,800 | 3,327,989 | 3,327,989 | - | 2,309,250 | 1,997,218 | 1,997,218 | - |
| (iv) | වෙනත් ආදායම් | 26,335,300 | 17,608,700 | 18,639,261 | 41,760 | 17,729,000 | 12,738,988 | 11,925,397 | 1,072,321 |
| | | 47,985,100 | 29,839,654 | 30,206,176 | 9,643,218 | 34,339,250 | 22,649,613 | 23,761,844 | 10,009,740 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 1429 කට අදාලව රු.1,952,381 ක හිඟ ශේෂයක් පැවතුණ අතර ඉන් රු.1,466,847 ක් වූ ශේෂවල හිඟ කාල සීමාව වසර 3 ක් ඉක්මවා තිබුණි. | වසර 03 ඉක්මවා ඇති වරිපනම් හිඟ ශේෂයෙන් රු.40,981 ක මුදලක් 2024 මාර්තු 31 දින වන විට අයකර ගෙන ඇති බවත්, ඉතිරි හිඟ ශේෂයන් අයකර ගැනීමට රතු නිවේදන යැවීමටත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | සභාව සතු කඩ කාමර 266 න් 232 ක් බදු දී තිබූ අතර ඉන් බදුකරුවන් 168 දෙනෙකුගෙන් රු.6,795,959 ක කඩ කුලී ශේෂයක් අයවීමට තිබුණි. ඉන් බදුකරුවන් 45 දෙනෙකුගේ රු. 5,356,778 ක් වූ ශේෂවල හිඟ කාල සීමාව වසර 03 ඉක්මවා තිබුණි. | සියළුම බදුකරුවන් දැනුවත් කර ඇති බවත් හිඟ කඩකුලී අයවීමට ඇති බදුකරුවන්ට විරුද්ධව මේ වන විට නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 25 ක් ගිවිසුම්ගත වීමකින් තොරව බදු දී තිබුණි. | බදුකරුවන් ලිඛිතව දැනුවත් කර ඇති බවත් එසේ ගිවිසුම්ගත වීමට කැමැත්ත පල නොකරන කඩ කාමර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව කඩ කාමර 18 කින් රු.929,554 ක එක්වන් මුදලක් අය කර ගැනීමට තිබුණු අතර 05 වන ඡේදය ප්‍රකාරව සභාවට අයත් වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 133 ක බදු ගිවිසුම් වසර 02 ත් වසර 32 ත් අතර කාල පරාසයක සිට යාවත්කාලීන කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව ලෝක වෙළෙඳපොල කඩ කාමර සංකීර්ණයේ කඩ කාමර 99 ක බදු මුදල් තක්සේරුව යාවත්කාලීන කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව කඩ කාමර 14 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි. | ඉතිරි එක්වන් මුදල් සමථ මණ්ඩලය හරහා ගෙවීමට කැමැත්ත පල කර ඇති බව හා විධිමත්ව කඩ කාමර ඉදිකර බදු දීමට සභාවේ අවධානය යොමුව ඇති බව. එසේම කඩකාමර තක්සේරුව ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව හා අතුරු බදු දීම් පරීක්ෂාවට කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | වෙළෙඳ සංකීර්ණ 02 ක කඩ කාමර 43 ක් නඩත්තු නොකිරීම හේතුවෙන් වසා දමා තිබූ අතර එම කඩ කාමර වලින් රු.3,843,749 ක කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. | පොදු වෙළඳපොළ ආකර්ශනීය ලෙස අළුත්වැඩියා කිරීමට තීරණය කර ඇති අතර එම කටයුතු ආරම්භ කිරීමෙන් පසු වසා දමා ඇති කඩ කාමර පිළිබඳ තීරණයක් ගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,956,726 ක් හා මුද්දර ගාස්තු රු. 34,647,002 ක් විය. | ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කායර්න් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------ | ----------- |
| (අ) | රු.9,000,000 ක ව්‍යාපෘති 2 ක් ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද එය ඉටු කර නොතිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය පහසුකම් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව හා එම ව්‍යාපෘතිය සඳහා එකඟතාවය 2024 වර්ෂය වෙනුවෙන් ලැබී ඇති බව. | එම ව්‍යාපෘති කඩිනමින් ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ අවසන් කර තිබූ නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ ගොඩනැගිල්ල පරීක්ෂාවේ දී එය නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා ඵලදායි ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර එක්රැස් කර තිබූ පොලිතින්, ප්ලාස්ටික් ඇතුළු නොදිරන කසල ඉතා අවිධිමත්ව රඳවා තිබුණි. | සභා අරමුදලෙන් එකවර විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කළ නොහැකි අතර අදියරෙන් අදියර එම කටයුතු නිම කරමින් පවතින බව. | විධිමත් කසළ කළමණාකරන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක වෙළෙඳපොළ කඩ කාමර සංකීර්ණ භූමියෙහි කඩ කාමර 07 ක් අනවසරයෙන් ඉදිකර තිබූ අතර එම අනවසරයෙන් ඉදිකර තිබූ කඩ කාමර 03 ක් වෙනත් පාර්ශවයන්ට බදු දී තිබුණි. එසේම මෙම සංකීර්ණයේ කඩකාමර කිහිපයක සැලැස්ම වෙනස් කර පාරිභෝගිකයන් ආකර්ෂණය නොවන අයුරින් විවිධ ඉදිකිරීම් සිදුකර තිබූ බැවින් එම කඩ කාමර බොහෝමයක් වසා දමා තිබුණි. | කඩකාමර සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාව තීරණය කර ඇති බව හා පොදු වෙළඳපොළ කඩ කාමර පාරිභෝගිකයන්ට ආකර්ෂණය වන අයුරින් බදුකරුවන්ගේ ඉල්ලීම අනුව කාර්මික නිලධාරීන්ගේ උපදෙස් අනුව බදුකරුවන්ගේ මුදලින් නවීකරණය කිරීමට සාකච්ජා කර ඇති බව. | අනවසර ඉදිකිරීම් හා කඩ කාමර ඵලදායීව භාවිතයට ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුල ගොඩනැගිලි අයදුම්පත් 286 ක් අනුමත කර ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර ලබාදී වසර 3 ත් 7 ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් ඉන් ගොඩනැගිලි 32 කට පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබුණි. එය අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 11 ක් විය. | සංවර්ධන බලපත්‍ර ලබා ගත් සියළුම ගොඩනැගිළි සැලසුම් පරීක්ෂා කර බලා අවශ්‍ය උපදෙස් එම අයිතිකරුවන් වෙත දැනුම් දීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අවස්ථා 02කදී මිලදී ගත් රු.201,800 ක ද්‍රව්‍ය තොග ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | මිලදී ගන්නා සියළු ද්‍රව්‍ය තොග පොත් වලට ඇතුලත් කර නිකුත් කිරීමට ගබඩා නිලධාරී හා සියළුම විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික සම්මේලනයක් සඳහා සහභාගී වීම සඳහා අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂවලදී රු.215,900 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. | දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිවලින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ගබඩා ගිණුම් සාරාංශයේ ඇතුලත් රු.25,593,658 ක් වටිනා ගබඩා තොග ශේෂ 11 ක් වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින අතර එම ශේෂයන් සඳහා සභාව සතුව භෞතිකව තොගයක් නොතිබුණි. | මෙම ශේෂ වටිනාකම් ගබඩා සාරාංශයෙන් පමණක් ගිණුම් සැකසීම සඳහා දිගින් දිගටම ඉදිරිපත් කළ ද ගබඩාව සතුව මේ සම්බන්ධව කිසිදු ලේඛනයක් මේ දක්වා නඩත්තු වූ බව සොයා ගත නොහැකි බව. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඇල්ලවෙල ක්‍රීඩා පිටිය පුළුල් කිරීමේදී පස් ඝන මීටර් 4184 ක් කපා එම කපන ලද පස් මීටර් 100 ක් ඇතුළත ක්‍රීඩාපිටිය අසල තුනී කිරීමට දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් 2021 වර්ෂයේ දෙවන භාගය සඳහා Ew-10 යටතේ හඳුන්වා දී තිබූ ගොඩනැඟිලි මිල ගණන් අනුව (BSR) රු. 126 ක රේටය භාවිතා කළයුතු නමුත්, පස් කපා කිලෝමීටර් 01 ක දුරකට ප්‍රවාහනය කිරීම වෙනුවෙන් Ew-10a යටතේ හඳුන්වා දී තිබූ ගොඩනැඟිලි මිල ගණන් අනුව (BSR) රු. 239 ක රේටය භාවිතා කර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම නිසා පස් ඝනමීටරයකට රු.113 බැගින් රු.472,792 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පස් කණ්ඩියෙන් කපන ලද පස් ප්‍රමාණය 4447.98 $m^3$ පමණ වූ අතර, එහිදී ගෙවීම් සිදු කොට ඇත්තේ 4184 $m^3$ ක ප්‍රමාණයට පමණි. මෙහිදී අතිරික්ත පස් ප්‍රමාණය 263.98 $m^3$ ක පමණ ප්‍රමාණය ක්‍රීඩා පිටියේ බෑවුම් සහිත ප්‍රදේශය පිරවීම සඳහා යොදා ගන්නා ලද බව ඇස්තමේන්තු ප්‍රකාරව ගෙවීම් සිදු කර ඇති පස් ප්‍රමාණයන් ගිවිසුම්ගත සමිතිය විසින් ක්‍රීඩා පිටියෙන් ඉවත් කර ගෙන ඇති බව හා ක්‍රිඩා භූමිය තුළ පස් 4184$m^3$ ක ප්‍රමාණයක් ඇතිරීම කළ නොහැකි බැවින් එම ප්‍රමාණය එම භූමියෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලද බව. | නිවැරදි රේටයන් භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විලේහේන යාකබැද්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.291,696 ක් වැයකර ඉදිකර තිබූ පෙට්ටි බෝක්කුවෙහි වැඩ 2020 දෙසැම්බර් 28 වන දින අවසන් කර තිබූ නමුත් වසර 03 කට ආසන්න කාලයක් ගතවී තිබුණද එම බෝක්කුව භාවිතයට ගත හැකි වන පරිදි සකස් කර දැනට පවතින මාර්ගයට සම්බන්ධ කළහැකි වන පරිදි ඉදිකර නොතිබුණි. | මාර්ග 03ක් ඒකාබද්ධ වන පරිදි ජනතාවගේ ඉල්ලීම මත බෝක්කුව ස්ථාපනය කර ඇතත් එක් පසෙක පවතින රජයේ බලපත්‍ර ඉඩමක හිමිකරුවන් විසින් මාර්ගය පුළුල් කිරීමට එකඟ නොවීම හා මාර්ග සංවර්ධනයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය වෙන් කර දෙන මෙන් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති බව. | ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | හේනේගම මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා රු.4,342,061 ක් වැයකර තිබූ අතර එහි වැඩ විෂයයන් 4 ක් සඳහා අදාළ නියමිත රේටයන් සහ පස් ප්‍රමාණය නිවැරදිව ගණනය නොකිරීම නිසා රු.1,800,403 ක් අදාල කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | මෙම කර්මාන්තයේදී පස් ගොනු කිරීමක් සිදු නොකරන ලද අතර පස් ප්‍රමාණය ගණනය කරනු ලැබුවේ මට්ටම් ගැනීමකින් බවත් කර්මාන්තය සිදු කිරීමේදී පස් කපනු ලබන ස්ථානයේ සිට 100m පමණ දුරින් වැඩ බිම පිහිටා තිබූ හෙයින් කපන ලද පස් ප්‍රමාණය ලිහිල් පස් ප්‍රමාණය බැවින් එම ප්‍රමාණයම වැඩ බිමට ගෙන ගොස් ඇතිරීම සිදු කර ඇති බැවින්, මුළු පස් ප්‍රමාණයම වැඩ බිමේදී භාවිත් කිරීම සිදු කරනු ලබන හෙයින් වැඩිපුර ගෙවීමක් සිදු වී නොමැති බව | නියමිත රේටයන් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඈ) | පරදූව කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ නොදිරන කසළ එක්රැස් කරන ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා අතරුඳවුම් මුදල රඳවාගෙන කොන්ත්‍රාත්කාර සමිතියට රු.1,652,228 ක් ගෙවා තිබූ අතර ඉටු නොකළ වැඩ කොටස් සඳහා රු.52,567 ක්ද නිසි ප්‍රමිතියට ඉටු නොකළ වැඩ කොටස් සඳහා රු.165,757 ක්ද සහ නියමිත රේටය භාවිතා නොකිරීම හේතුවෙන් රු.9,761 ක් ද ලෙස එකතුව රු.228,085 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීම් කර තිබුණි. | කර්මාන්තයේ ඉටු නොකළ වැඩ වලට ගෙවීමක් සිදු කර නොමැති බව, නිසි ප්‍රමිතියට කර්මාන්තය සිදු කළ බව හා නියමිත රේටයන් භාවිතා කළ බව. | නියමිත රේටයන්ට හා ඉටු කළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඉ) | සභාව සතු ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය සඳහා රු.1,992,735 ක් වැය කර තිබූ අතර කාල පරිච්ඡේදයට නියමිත රේටයන් භාවිතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු රු.221,719 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද ගිවිසුම්ගත සියළු වැඩ කොටස් නිමකර නොතිබියදී සියළු වැඩ කොටස් නිම කළ බවට සලකා ගෙවීම් සිදුකර තිබුණි. | ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ පැවැති මිල ගණන්වලට අනුව ඇස්තමේන්තු සකස් කළ බවත් සමිතියට වැඩිපුර ගෙවා ඇති මුදල රැඳවුම් මුදල් වලින් අයකර ගන්නා බව. | නියමිත රේටයන්ට හා ඉටු කළ වැඩ කොටස් අනුව ගෙවීම් සිදු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් 09 දෙනෙකුට තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,175,841 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | ප්‍රමාණවත් සේවකයින් නොමැති බැවින් මෙසේ රාජකාරී පැවරීම් සිදු කර ඇති බව. | තනතුරට අදාල රාජකාරී පැවරීම් සිදු කළ යුතුය. |